Royal College – Colombo 07

රාජකීය විද්‍යාලය කොළඹ 07

Grade 11 Second Term Test 2022

දෙවන වාර පරීක්ෂණය - 2021

Sinhala (Second Language) I, II

දෙවන බස සිංහල

විෂය අංකය 64 කාලය පැය 03

Note :

(I) Answer all questions.

(II) In each of the questions from 1 to 40 pick one of alternatives (1), (2), (3), (4) which you consider as correct or most appropriate.

- අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරින්** ඇති පදය වෙනුවට යෙදිය හැකි සුදුසු පදය තෝරන්න
  In question 1-5 select the most suitable pair of words for the word printed in **bold letters**

1. ඔයා **යන්නෑ** නේද?
   (i) යනවා නෑ (ii) යන්න නෑ
   (iii) යන්නෙ නෑ (iv) යන්නේ නෑ

2. නිතරම ජංගම දුරකථය **බලන්නෙපා**
   (i) බලන්නෙ එපා (ii) බලන්නේ එපා
   (iii) බලන්න එපා (iv) බලනවා එපා

3. ඔයා බත් **කන්නැද්ද?**
   (i) කන්නේ නැද්ද? (ii) කනවා නැද්ද?
   (iii) කමින් නැද්ද? (iv) කන්නේ නැද්ද?

4. මං එන්න කලින් **කෑවොත්තෙහෙම** බලාගෙනයි
   (i) කෑවත් එහෙම (ii) කෑවොත් එහෙම
   (iii) කෑවා එහෙම (iv) කනවා එහෙම

5. මම **අම්මත්තෙක්ක** පන්සලට යනවා
   (i) අම්මත් එක්ක (ii) අම්මත් තෙක්ක
   (iii) අම්මා එක්ක (iv) අම්මව එක්ක

- අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතරින් නිවැරදි උච්ඡාරණය සහිත පදය තෝර ගන්න
  In question 6-10 Select the word with **correct pronunciation** from the words given

6. (i) වැට (ii) වැට්ට (iii) වෙට (iv) වැට

7. (i) දකුණු පැත්තෙන් (ii) දකුණු පෙත්තෙන් (iii) දකුණු පෙද්තෙන් (iv) දකුණු පැද්තැන්

8. (i) කැමති (ii) කැමැති (iii) කෙමති (iv) කෙමෙති

9. (i) තාක්සනය (ii) තාක්ෂණය (iii) තාක්ෂනය (iv) තාක්සණය

10. (i) කමත (ii) කැමත (iii) කමට (iv) කමත්ත

- අංක 11 සිට 14 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය සඳහා වඩාත් ගැළපෙන ප්‍රශ්නය තෝරන්න
  Select the most appropriate and suitable questions for given sentences in questions from 11 to 14.

11. සුදේස් රචනා **තරගයෙන්** ජය ගත්තේය.
   (i) සුදේස් රචනා තරගයෙන් ජය ගත්තේ ඇයි? (ii) රචනා තරගය තිබුණේ කොහේද?
   (iii) තරගයෙන් ඔහුට ලැබුණේ මොනවාද ? (iv) සුදේස් ජයගත්තේ මොන තරගයෙන්ද?

12. ඉල්හාම් සිංහල පොත කියවනවා.
   (i) ඉල්හාම් කියවන්නේ මොන පොතද? (ii) ඉල්හාම් පොත් කියවන්න දන්නවාද?
   (iii) ඉල්හාම් පොත් විතරද කියවන්නේ? (iv) ඉල්හාම් කියවන්නේ මොකටද?

13. මම සිංහල විෂයට කැමතියි
   (i) සිංහල විෂය ලේසිද? (ii) ඔයාට සිංහල විෂය පුළුවන්ද?
   (iii) ඔයා සිංහල විෂයට කැමති ඇයි? (iv) ඔයා කැමති විෂය මොකක්ද?

14. ලබන මාසේ අපි ගමේ යනවා
   (i) ගමේ යන්නේ කවදාද? (ii) ගමේ යන්නේ මොකටද?
   (iii) ගමේ යන්නේ කාත්තෙක්ද? (iv) ගමේ යන්නේ ලබන මාසේද?

- අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල නිවැරදිව අකුරු යෙදී ඇති පදය තෝරන්න
  Select the word with correct spelling in questions from 15 to 20.

15. (i) සංවිදායක (ii) සන්විදායක (iii) සංවිධායක (iv) සංවෘධායක

16. (i) අද්‍යාපනය (ii) අධ්‍යාළනය (iii) අධ්‍යාපණය (iv) අධ්‍යාපනය

17. (i) මන්ඩලය (ii) මණ්ඩලය (iii) මණ්ඩළය (iv) මන්ඩළය

- අංක 18-20 තෙක් ප්‍රශ්නවල නොගැළපෙන පදය තෝරන්න.
  In question 18-20select the inappropriate word

18. (i) ගස් (ii) පැළ (iii) යන්ත්‍ර (iv) පොහොර

19. (i) පෑන් (ii) පැන්සල් (iii) පොත් (iv) සරුංගලය

20. (i) මහවැලි (ii) දිවයින (iii) ලංකාදීප (iv) මව්බිම

අංක 21 සිට 23 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට සමානාර්ථ පදය තෝරන්න
Select the inappropriate word in questions from 21 to 23.

21. කඳුළු සලනවා
   (i) අඩනවා (ii) හිනැහෙනවා (iii) හඩලනවා (iv) සිතනවා

22. නැකත
   (i) පූජාව (ii) සුබ වේලාව (iii) තෑග්ග (iv) පවුලේ අය

23. ආසනය

(i) ඇද (ii) ආසාව (iii) පුටුව (iv) ස්ථානය

- අංක 24 හා 25 ප්‍රශ්න වල මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදය තෝරන්න.
  In question 24 and 25 select the **antonym** for the word given at the biginning

24. දෙන්න

(i) යාම (ii) දිනන්න (iii) ගන්න (iv) යන්න

25. පහසු

(i) නොපහසු (ii) අපහසු (iii) සුපහසු (iv) නොවපහසු

අංක **26** සිට **28** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා **වඩාත් ගැළපෙන ප්‍රකාශය** තෝරන්න.
Select the **most suitable statement** for the picture given in each questions **from 26 to 28**.

26.



(i) වාහන නැවැත්වීම තහනම්
(ii) වාහන සඳහා පමණයි
(iii) කාර් ඇතුළු වීම තහනම්
(iv) වාහන ධාවනය සඳහා පමණයි

27.



(i) වාහන සඳහා තහනම්
(ii) වාහන සඳහා පමණයි
(iii) බස්රථ නැවැත්වීම තහනම්
(iv) බස්රථ සඳහා පමණයි

28.



(i) පදිකයින් ගමන් කරන ස්ථානය
(ii) පාපැදි කරුවන් ගමන් කරන ස්ථානය
(iii) රථවාහන ගමන් කිරීම තහනම්
(iv) පාසල් පදිකයින් සඳහා පමණයි

අංක 29 සිට 30 ප්‍රශ්න වලට ගැළපෙන උත්තරය තෝරන්න.
For questions 29 and 30 Select the suitable answer.

29. අද බදාදා නම් අනිද්දා කවදාද?
(i) ඉරිදා (ii) සෙනසුරාදා
(iii) සිකුරාදා (iv) බ්‍රහස්පතින්දා

30. පහත සඳහන් පද අතුරින් යුගල පදයක් නොවන්නේ
(i) යානවාහන (ii) ලට්ටලොට්ට
(iii) සුපිරිසිදු (iv) වටින්පිටින්

- අංක 31 සිට 32 ප්‍රශ්න වලට වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක සම්බන්ධ කර එක වාක්‍යක් ලෙස නිවැරදිව ලියා ඇති වාක්‍ය තෝරන්න.
  Two sentences agre given in each questions 31 and 32. Select the correct sentence that combine both separate sentences.

31. ගායිකාවක් ගීයක් ගැයුවාය. ගායිකාව සිනාසුනාය
(i) ගායිකාවක් ගීයක් ගයමින් සිනාසුණාය (ii) ගායිකාවක් ගීයක් ගයා සිනාසුණාය
(iii) ගායිකාවක් ගීයක් ගයද්දී සිනාසුණාය (iv) ගායිකාවක් ගීයක් ගය ගයා සිනාසුණාය

32. ගුරුතුමිය ඉගැන්වුවාය. ගුරුතුමිය පොත් බැලුවාය
(i) ගුරුතුමිය උගන්වද්දී පොත් බැලුවාය (ii) ගුරුතුමිය ඉගැන්වූ පසු පොත් බැලුවාය
(iii) ගුරුතුමිය පොත් බලද්දී ඉගැන්වුවාය (iv) ගුරුතුමිය පොත් බලන්න ඉගැන්වුවාය

අංක 33 සිට 34 ප්‍රශ්නවල හිස් තැනට වඩාත් සුදුසු පදය තෝරන්න
Select the most suitable word for filling the blanks questions 33 and 34.

33. මම ______________________ කළුතරට ගියෙමි
(i) දුම්රිය (ii) දුම්රියට (iii) දුම්රියෙන් (iv) දුම්රියක්

34. _______________ පන්තියට යන්න
(i) ඉක්මනේ (ii) ඉක්මන් (iii) ඉක්මන (iv) ඉක්මනින්

- අංක 35 ප්‍රශ්නයේ කළු කර ඇති සංඛ්‍යාව නිවැරදිව අකුරෙන් ලියා ඇති උත්තරය තෝරන්න.
  In question 35 select the answer that gives in letters correctly in the number in bold print.

35. 1815 දී ________________ ලංකාව ඉංග්‍රීසි පාලනයට යටත් විය
(i) දා හට පහළොව (ii) එකසිය අසූ පහළොව
(iii) එක් දහස් පහළොව (iv)එක් දහස් අටසිය පහළොව

අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න
Select the grammatically correct sentences in questions from 36 to 40.

36. (i) ගස් වැල් අපට ඉතා ප්‍රයෝජනවත් වෙයි (ii) ගස් වැල් අපට ඉතා ප්‍රයෝජනවත් වෙති
(iii) ගස් වැල් අපට ඉතා ප්‍රයෝජනවත් වෙමු (iv) ගස් වැල් අපට ඉතා ප්‍රයෝජනවත් වන්නෝය

37. (i) මම පන්සල් ගියෙමි (ii) මම පන්සල් ගියෙමු
(iii) මම පන්සල් ගියෝය (iv) මම පන්සල් ගියහ

38. (i) සැවොම අපට උදව් කරති (ii) සැවොම අපිට උදව් කරති
(iii) සැවොම අපිට උදව් කරන්නහු (iv) සැවොම අපට උදව් කරමු

39. (i) කවීන් සහ කවීෂ්කරන් රුස්වීමට සහභාගි වෙමු
(ii) කවීන් සහ කවීෂ්කරන් රුස්වීමට සහභාගි වෙති
(iii) කවීන් සහ කවීෂ්කරන් රුස්වීමට සහභාගි වන්නේය
(iv) කවීන් සහ කවීෂ්කරන් රුස්වීමට සහභාගි වන්නී ය

40. (i) ශිෂ්‍යාවක් සින්දුවක් කිව්වාය (ii) ශිෂ්‍යාවක සින්දුවක් කිව්වාය
(iii) ශිෂ්‍යාවක් සින්දුවක් කිව්වෝය (iv) ශිෂ්‍යාවක සින්දුවක් කිව්වේය

Royal College – Colombo 07
රාජකීය විද්‍යාලය කොළඹ 07
Grade 11 Second Term Test 2022
දෙවන වාර පරීක්ෂණය - 2021
Sinhala (Second Language) I, II
දෙවන බස සිංහල

දී ඇති මාර්ගගෝදේශ ආශ්‍රය කර ගනිමින් පහත දැක්වෙන මාතෘකාවලින් එකක් ගැන වචන 100ක රචනයක් ලියන්න.
Write an essay of about 100 words on any one of the following topics in accordance with the given guidlines.

I කොටස /Part I

(අ) කොවිඩ් මාරයාගෙන් ජයගමු
(i) කොවිඩ් රෝගය ගැන හැඳින්වීම
(ii) පිළිපැදිය යුතු සෞඛ්‍ය නීතිරීති
(iii) රෝගය වැළඳීමට හේතු
(iv) කොවිඩ් රෝගයේ බරපතල බව හා මිදීමට කළ යුතු දේවල්
(v) සමාලෝචනය


(ආ) පුස්තකාලය ප්‍රයෝජනයට ගමු
(i) හැඳින්වීම
(ii) පුස්තකාලයක වැදැගත්කම
(iii) වර්තමානයේ පුස්තකාලය ප්‍රයෝජනයට නොගැනීමට හේතු
(iv) අප විසින් කළ යුතු යුතුකම්
(v) සමාලෝචනය

(ඉ) ගුරුවරුන්ට ගරු කරමු
(i) ගුරුවරුන් යනු කවුරුන්ද ?
(ii) ගුරුවරුන්ට අද අත් වී ඇති තත්වය
(iii) ගුරුවරුන්ට ගරු කළ යුත්තේ ඇයි
(iv) ගුරුවරුන් වෙනුවෙන් කළ හැකි දේ

(ඊ) වර්තමාන ජංගම දුරකථනය
(i) හැඳින්වීම
(ii) වර්තමාන ජංගම දුරකථනය භාවිතය
(iii) ජංගම දුරකථනයේ ප්‍රයෝජන
(iv) ජංගම දුරකථනයේ අයහපත් ප්‍රතිපල
(v) සමාලෝචනය

(උ) මා විදුහල්පතිවරයෙක් වුණොත්
(i) කල්පිත මාතෘකාවක් ලෙස සලකා රචනයට අදාළ පසුබිම සකස් කිරීම
(ii) විදුහල්පතිවරයෙකු වීමට ලැබුණොත් කරන දේවල් උපකල්පනය කිරීම
(iii) විදුහල්පතිවරයෙකු බවට පත් වීම
(iv) විදුහල්පතිවරයෙකු වීම නිසා සතුටට පත් වීම
(v) සමාලෝචනය

2. දී ඇති පින්තූරය බලා ඒ ඇසුරෙන් අර්ථවත් වාක්‍ය පහක් ගොඩනගන්න.
(වාක්‍යයක අවම වශයෙන් වචන හතරක්වත් තිබිය යුතුය )
Compose five meaningful sentences with reference to the given picture. (there should be four words meaningfully in the sentences.)



II කොටස /Part II

- 3 හා 4 යන ප්‍රශ්න වලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.
  From question 3 and 4 answer only one question.

3. අයන්න කියන්න ලොවට ම ඇහෙන්න එන්න මගේ මල්ලී
දුවන්න පනින්න නටන්න ගයන්න එන්න මගේ නංගී//
එන්න මගේ මල්ලී ...... එන්න මගේ නංගී .......

පාසල නම් රන් දෙවොලේ දෙවියන් වන් ගුරු කැළගේ
සිත දිනමින් පා සෙවනේශිල්ප ලබා මතු දවසේ
ලෝකය දකින්න එහි සැරි සරන්න
එන්න මගේ නංගි එන්න මගේ මල්ලි .....

කාසි පනම් හිටි හැටියේ සතුරෝ ගෙන යති රහසේ
පොතින් පතින් ලද දැනුමේ ධනය සදාකල් සුරැකේ
නය වඩන්න කාලය ගෙවන්න
එන්න මගේ නංගි එන්න මගේ මල්ලි
අයන්න කියන්න ........

(i) මෙම කවි පංතියේ නංගිට හා මල්ලිට එන්න කියන්නේ කුමක් සඳහාද ?
(ii) මෙහි පාසල සමාන කර ඇත්තේ කුමකටද?
(iii) මෙහි සඳහන් ක්‍රියා පද 2ක් ලියන්න
(iv) මෙහි සඳහන් පරිදි සදාකල් සුරැකෙන්නේ කුමක්ද?
(v) සමාන පද ලියන්න
- රෝග
- පාෂාණ

4 පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න
Answer the given questions with reference to the following paragraph

ලුණු යනු ඉතා වටිනා සම්පතකි. ලුණු සත්වයාගේ ආහාරය සඳහා අවශ්‍ය වුව ද, වැඩියෙන් ගැනීම භයානකය. ආහාර කල් තබා ගැනීම සඳහා ලුණු යොදා ගනියි. මිනිස් ආහාරයට ගන්නා ලුණු , මුහුදු ලුණු, මේස ලුණු, අයඩීන් ලුණු යනුවෙන් කොටස් තුනකි. මුහුදු පාෂාණවලින් ලබා ගන්නා ලුණු ලා රෝස පාට හෝ අළු පාට වේ. එයට හේතුව එහි ඇති ඛනිජ සංයුතියයි. ආහාරයට ගන්නා ලුණු අළු පාට වේ. ලුණු අඩංගු ප්‍රධාන සංඝටක දෙකකි. ඒවා ක්ලෝරයිඩ් හා සෝඩියම් වේ. ශරීරයේ ජලය පාලනයට ලුණු හේතු වේ. ආහාර රසවත් කිරීමට ද ලුණු යොදා ගනියි. අධික ලුණු භාවිතා කිරීම මගින් හදවත් රෝග ඇති වේ.

(i) ලුණු භයානක වෙන්නේ ඇයි?
(ii) ආහාරයට ගන්නා ලුණු මොන පාටද?
(iii) ලුණු වල අඩංගු ප්‍රධාන සංඝටක දෙක කුමක්ද?
(iv) ආහාර වලට ලුණු වලින් වන ප්‍රයෝජන 2ක් ලියන්න
(v) සමාන පද ලියන්න
- ආහාර
- ශරීරය

## කොටස III / Part III

5 හා 6 ප්‍රශ්න දෙකටම උත්තර සපයන්න
Answer both questions 5 and 6.

(5) පහත දී ඇති විස්තරය කියවා ඒ ඇසුරින් ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න.
රත්නපුර මධ්‍ය මහා විද්‍යාලයේ වසරක් පාසා පැවැත්වෙන ත්‍යාග ප්‍රදානෝත්සවය 2022 පෙබරවාරි මස 15වන දින පෙ.ව. 9.30 සිට රත්නපුර ප්‍රාදේශීය ලේකම්තුමා වන සිරිත් සුබෝද මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

නැතහොත් / Or

ගමේ සංවර් ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතා, ඔබ ප්‍රදේශයේ තරුණ හා ළමා පිරිස සඳහා ක්‍රීඩා පිටියක් හා පුස්තකාලයක් ලබා දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය සභාවේ සභාපති වන අකිල හේරත් මහතාට ලිපියක් සකස් කරන්න.

(6) පහත දැක්වෙන ඉංග්‍රීසි වාක්‍ය සිංහලයට පරිවර්තනය කරන්න
Translate the following English sentences into Sinhala.

(i) Go tomorrow itself
(ii) My mother tongue is Tamil
(iii) What is your father's name?
(iv) I wish you good luck'
(v) I have read many story books

නැතහොත් / Or

දිගු කලකට පසු හමු වූ , ඔබට කුඩා කල පාඩම් ඉගැන්වූ ගුරුවරයෙක් හෝ ගුරුවරියක් සමග ඇතිවන කතාබහ සංවාදයක ස්වරූපයෙන් ලියන්න. එහිදී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගන්න.
(i) ආමන්ත්‍රණය හා ආචාර කිරීම
(ii) ගුරු ජීවිතය පිළිබඳ තොරතුරු විමසීම
(iii) සුවදුක් විමසීම
(iv) වර්තමාන තොරතුරු විමසීම
(v) සමුගැනීම